**තල් සංවර්ධන මණ්ඩලය - 2018**
--------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

තල් සංවර්ධන මණ්ඩලයේ ("මණ්ඩලය") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්ව විද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විශේෂිත ප්‍රමිතියට යොමු නොකිරීම | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| රු. මිලියන 23.7 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් තවදුරටත් මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන අතර, මෙම තක්සේරු කිරීමේ දෝෂය නිවැරදි කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට 3 ට අනුකූලව කටයුතු කර නොතිබුණි. | පහත සඳහන් වත්කම් නැවත ඇගයීම සඳහා මණ්ඩලය දැනටමත් තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.<br>ලොරි - 02<br>ඉන්දියානු පිකප් - 04<br>පැජෙරෝ - 01<br>පළතුරු පදනම් කරගත් නිෂ්පාදන මධ්‍යස්ථාන යන්ත්‍ර. | මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සාධාරණ ඇස්තමේන්තු භාවිතා කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ වාහන 03 ක් විකිණීමෙන් ලැබුණු 563,500 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඇතුළත් කර නොතිබුණි. | වාහන 03 ක් විකිණීමෙන් ලත් රු. 563,500 ක් 2018 ජූලි මාසය අවසානයේදී (2018-01-01 දින) පහත සඳහන් පරිදි විවිධ ආදායම් තුළ ඇතුළත් කර ඇත.<br><br>පී/23 760988 , පී/23 760989 සහ පී/23 760990. 2018-07-01 දින ඇතුළත් කර ඇති මුළු ආදායම රු. 631,646 කි. | ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පැහැදිලිව හඳුනාගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6 .1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අවුරුදු 2 සිට 6 දක්වා වූ කාල පරාසයකට අයත් කණ්ඩායම් 10 කින් ලැබිය යුතු රු. 4,759,319 ක ණය ආපසු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. මීට අමතරව, රු. 5,316,695 ක් වූ ණය ගැතියන් 12 දෙනෙකුගෙන් ශේෂය තහවුරු කිරීමේ ලිපි ලබා ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. | • වරින් වර ලිපි යවන ලදී<br><br>• නීති උපදෙස් අනුව නීතිමය පියවර ගනු ලැබේ<br><br>• වැඩිදුර ක්‍රියාමාර්ග සඳහා නීති උපදේශක වෙත ඉදිරිපත් කරන ලදී | නියමිත වේලාවට හිඟ මුදල් අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 110 | අලාභ හානි පිළිබඳ ලේඛනයක් මණ්ඩලය විසින් නඩත්තු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභ හා හානි ලේඛනයක් නඩත්තු කිරීම මණ්ඩලය විසින් ආරම්භ කර ඇත. | මුදල් රෙගුලාසියට අනුකූල විය යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 272 (3) | අදාළ මාසය අවසානයේ සිට සති හයකට නොඅඩු කාලයකදී මණ්ඩලය විසින් ගෙවීම් වවුචර මාසිකව විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එපරිදි එම වවුචර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මණ්ඩලය විසින් අනෙකුත් දිස්ත්‍රික්කවලින් පිළිගැනීම් ලැබීමට ප්‍රමාද වී ඇත. කෙසේ වෙතත්, කෙසේ වෙතත්, මෙම අඩුපාඩුව මඟහරවා ගැනීමට කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගෙන ඇති අතර ඉදිරියේදී නියමිත වේලාවට ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. | මුදල් රෙගුලාසියට අනුකූල විය යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 751(1) | • ලැබීම්, නිකුත් කිරීම් සහ ඉදිරියට ගෙන යන ශේෂය පැහැදිලිව පෙන්වන පරිදි ඉන්වෙන්ටරි ලේඛනය නිසි ලෙස නඩත්තු කර නොතිබුණි.<br>• තොග පොත්වල මිලදී ගැනීම් සටහන් කිරීමේ සහ ගබඩාවල | තොග පොත්වල මිලදී ගැනීම් සටහන් කිරීමේ සහ ගබඩාවල ඉන්වෙන්ටරි නඩත්තු කිරීම පිළිබඳ අඩුපාඩු කළමනාකරණය විසින් පිළිගෙන ඇත. මණ්ඩලය විසින් අදාළ | මුදල් රෙගුලාසියට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉන්වෙන්ටරි නඩත්තු කිරීම පිළිබඳ බොහෝ අඩුපාඩු විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. | කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර මෙම අඩුපාඩුකම් මඟහරවා ගැනීම සඳහා අභ්‍යන්තර විගණන පද්ධතිය ශක්තිමත් කර ඇත. | |
| (iv) මුදල් රෙගුලාසි 757(1)(ඇ), (2)(අ), (ආ) | • වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.<br>• ඉකුත් සමීක්ෂණ මණ්ඩල වාර්තාවල ඇතුළත් නිර්දේශ මණ්ඩලය විසින් නිසි ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි. | විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබේ. කලින් සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර ඇත. ඉකුත් සමීක්ෂණ මණ්ඩල වාර්තාවල ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කර ඇත. | මුදල් රෙගුලාසියට අනුකූල විය යුතුය. |
| **(ආ) රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED / 12 හි 2003 ජුනි 02:** | | | |
| - ඡේදය 4.2.2 | මූල්‍ය හා භෞතික වශයෙන් මාසික කාර්යසාධන ප්‍රකාශනය, මාසය සඳහා මෙහෙයුම් ප්‍රකාශනය, මාසය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ද්‍රවශීලතා තත්ත්වය සහ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ණය ගැනීම, විශේෂයෙන් මාසය තුළ මිලදී ගත් ජංගම නොවන වත්කම් සහ සේවක තනතුර සංඛ්‍යාව, නව බඳවා ගැනීම් ඇතුළු මානව සම්පත් පිළිබඳ ප්‍රකාශය චක්‍රලේඛ අවශ්‍යතා අනුව මාසික අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට මාසිකව වාර්තා ඉදිරිපත් කිරීමට කළමනාකාරිත්වය පියවර ගෙන තිබේ. | රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ උපදෙස් වලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| - ඡේදය 4.2.5 | මණ්ඩලයේ කාරක ප්‍රාග්ධනය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා මණ්ඩලය විසින් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි මාසික රැස්වීම් ලෙස සමාලෝචනය කිරීම සඳහා කළමනාකරණය නිසි පියවර ගෙන ඇත. | රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ උපදෙස් වලට අනුකූල විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 98,799,862 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 131,952,115 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 33,152,253 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ, සංවර්ධන හා පුහුණු වියදම් රු. 39,705,819 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------------- | ------------- |
| ආදර්ශ ගොවිපලවල් හතරක් අඛණ්ඩව පාඩු ලබමින් තිබුණි. පසුගිය වසර 4 තුළ සිදුවූ පාඩු රු. මිලියන 3 සිට රු. මිලියන 1.2 දක්වා පරාසයක පැවතුනි. තවද, මුළු භූමි ප්‍රමාණය අක්කර 128 ක් සහිත ආකෘති ගොවිපල හතරක කටයුතු 2010 වර්ෂයේ සිට ආරම්භ කර නොතිබුණි. | මුරකරුවන්ගේ පිරිවැය සහ ක්ෂයවීම හේතුවෙන් ගොවිපල පාඩු විය. කෙසේ වෙතත්, කළමනාකාරීත්වය විසින් නව කෘෂිකාර්මික තාක්ෂණය හඳුන්වා දී ඇත. | පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා සුදුසු උපාය මාර්ග සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | --------------------------------- | ------------- |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රු. 584,000 ක් වටිනාකමැති ඔඩියල්, වියළි ඔඩියල් සහ අමු පන්නඩු වැනි ආහාර ද්‍රව්‍ය තුනක් ඒවා ආරක්ෂිතව ගබඩා කිරීම සඳහා නිසි පහසුකම් නොමැති වීම හේතුවෙන් විනාශ වී තිබුණි. | එබැවින් වූ රු. 584,000 ක් වූ සැබෑ පාඩුව පිළිබඳ පරීක්ෂණ තවමත් සිදුවෙමින් පවතී. විමර්ශන කමිටු තීරණයට අනුව, කළමනාකරණය විසින් අදාළ කාර්ය මණ්ඩලයෙන් පාඩු අයකර ගනු ලැබේ. | පාඩු අවම කිරීම සඳහා නිසි පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>--------------------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ සංවර්ධන කටයුතු යටතේ තල් බීජ රෝපණය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 21 ක් වෙත සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට රු. 744,800 ක් ගෙවා තිබුණද, වගා කිරීමේ කටයුතු මේ වන තෙක් ආයතන විසින් ආරම්භ කර නොමැත. | අපි දෙසැම්බර් මාසයේ අරමුදල් නිදහස් කරන ලදී. එබැවින් නිසි වේලාවට ක්‍රියාත්මක කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන්ට නොහැකි වී ඇත. ඉදිරියේදී, නිසි වේලාවට අරමුදල් නිදහස් කිරීම කළමනාකරණය විසින් සලකා බැලිය යුතුය. | නියමිත වේලාවට අරමුදල් නිදහස් කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>----------------------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් අයවැය ප්‍රතිපාදන වශයෙන් රු. මිලියන 112.5 , රු. මිලියන 150 ක් සහ රු. 250 ක් තිකම් ස්කාගාරය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පිළිවෙලින් 2016, 2017 සහ 2018 යන වර්ෂවලදී ලබා දී තිබුණි. එයි ප්‍රතිඵලයක් ලෙස, සෘජු රැකියා අවස්ථා 23 ක් සහ ද්‍රව නිෂ්පාදනය මත ඇස්තමේන්තුගත සුරා බදු හා අනෙකුත් බදු ආදායම වශයෙන් රු. මිලියන 119 ක් රටට අහිමි වී තිබුණි. තවද, තල් නිෂ්පාදන මණ්ඩලයට ලබා දෙන සැපයුම් දාමය (supply chain) අහිමිවීම හේතුවෙන් තල් | ක්‍රියාමාර්ග ගනු ලබන්නේ රේඛීය අමාත්‍යාංශය විසිනි. | අයවැය ඇස්තමේන්තු නිසි ලෙස සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

නිෂ්පාදන මත යැපෙන පවුල් 15,000 කගේ ජීවනෝපායට අහිතකර ලෙස බලපා ඇති අතර, ස්කාගාර නිෂ්පාදනය අක්‍රීය වීම හේතුවෙන් දළ වශයෙන් දිනකට ලීටර් 30,000 ක පමණ නිෂ්පාදනයක් නාස්ති වී තිබුණි.

### 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මණ්ඩලය විසින් 2016 නොවැම්බර් 25 දින රු. 2,914,560 ක පිරිවැයකට මිලදී ගෙන තිබූ RO යන්ත්‍රය මේ දක්වා කිසිදු ක්‍රියාකාරකමක් සඳහා යොදා ගෙන නොතිබූ අතර, වසර 03 කට අධික කාලයක් තිස්සේ අක්‍රියව පැවතුනි. | තල් සංවර්ධන මණ්ඩලය විසින් 'ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය' යටතේ 2016 දී RO යන්ත්‍රය මිලදී ගන්නා ලදී. මෙහෙයුම් නිරූපණය යාපනයේ ස්ටැන්ලි පාරේ නිෂ්පාදන ඒකකයේ සිදු කර ඇත. මෑතකදී වේලානායි සමාජය විසින් පල්ප් සැකසුම් සඳහා ගොඩනැගිලි යටිතල පහසුකම් නිම කර තිබූ අතර ඔවුන්ට පල්ප් කාර්යක්ෂමව සැකසීම සඳහා RO යන්ත්‍රයක් අවශ්‍ය වී තිබූ බැවින්, මෙම යන්ත්‍රය එම සමාජයේ ඉල්ලීම මත ඔවුන්ට ලබා දී ඇත. | යන්ත්‍රය අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් හකුරු සැකසුම් කම්හල් තුනක් (3) රු. 20,862,150 ක පිරිවැයකට යාපනය, මැනර් සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල ස්ථාන ගත කර ඇත. කෙසේ වෙතත්, එම බලාගාර තවමත් කිසිදු නිෂ්පාදන කටයුත්තක් සඳහා යොදා ගෙන නොමැති අතර, සමාලෝචිත වර්ෂයේ ක්ෂයවීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල 4,172,430 ක් දක්වා | 2018 වර්ෂය තුළ පැනි සහිත කාලයේදී හකුරු සැකසීමේ යන්ත්‍ර 03 ක් ආරම්භ කර තිබුණි. දැනට මන්නාරම සහ ත්‍රිකුණාමලයේ හකුරු සැකසීමේ යන්ත්‍ර 02 ක් ක්‍රියාත්මක වේ. අනෙක් යන්ත්‍රය ක්‍රියාකාරී තත්ත්වයේ පැවතියද කරෙයිනගර් නිෂ්පාදන මධ්‍යස්ථානයේ අලුත්වැඩියා කටයුතු හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී ඇත. | යනුත්‍රය අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගත යුතුය. |

තිබුණි.

### 3 .6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය විසින් කයිතඩි හි තල් පාසල සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2018 සැප්තැම්බර් මාසයේදී රු. මිලියන 25 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට (මධ්‍යම) ගෙවා තිබූ අතර, ඉදිකිරීම් කටයුතු 2019 මාර්තු 12 වන දින අවසන් කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, එම මුදලින් රු. මිලියන 8.25 ක් එනම් සියයට 33 ක් පමණක් මෙම වාර්තාවේ දිනය තෙක් ඒ සඳහා යොදවා තිබුණි. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව සහ වහාම ඇස්තමේන්තුගත පිරිවැය තුළ ගොඩනැගිලි කටයුතු වේගවත් කිරීම සඳහා කළමනාකාරිත්වය ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට දැඩි ලෙස දැනුම් දී ඇත. | ඉදිකිරීම් කටයුතු ප්‍රමාදයකින් තොරව අවසන් කළ යුතුය. |

### 3.7 නොවිසඳුනු විගණන ගැටළු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මණ්ඩලයේ අභ්‍යන්තර විගණක කිසිදු අනුමැතියකින් තොරව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයෙකු ලෙස සේවය කර ඇති අතර, මණ්ඩලයේ ස්ථිර රැකියාව සඳහා වන වැටුපට අමතරව රු. 600,000 ක් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයෙන් ලබාගෙන ඇත.<br>(ආ) තවද, මණ්ඩලයේ අභ්‍යන්තර විගණක විසින් | (අ) සහ (ආ)<br>මේ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණ සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් කළමනාකාරිත්වයට උපදෙස් ලබා දී ඇති අතර, දිස්ත්‍රික් ලේකම් (යාපනය) විසින් වැඩිදුර කටයුතු සඳහා මූලික විමර්ශන | ගැටළුව අවසන් කිරීමට වහාම පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ව්‍යාජ ලිපි ලේඛන සකස් කර ඇති බව අනාවරණය වූ අතර, ඔහු විසින් ඔහු ඌව-වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක ලෙස සේවය කරමින් සිටි කාලය තුළ රු. 72,000 (ආසන්න වශයෙන්) මණ්ඩලයෙන් ගමන් වියදම් ඉල්ලීම් වශයෙන් ලබා ගෙන ඇත. | නිලධාරියෙකු දැනටමත් පත් කර ඇත. | |
| (ඇ) මණ්ඩලය විසින් බඳවා ගැනීමේ පරිපාටිය මගින් අනුමත කරන ලද සීමාව ඉක්මවා වැටුප් වර්ධක ලෙස කළමනාකරුවන් 8 දෙනෙකුට රු. 4,280,600 ක් ගෙවා තිබුණි.<br><br>(ඇ) තවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීමෙන් පසුව පවා මණ්ඩලය විසින් කරන ලද වැටුප් වර්ධකවල වැඩිපුර ගෙවීම් මත පදනම්ව ඉහත සඳහන් කළමණාකරුවන් 8 දෙනා සඳහා සේ.නි.අ.අ. (EPF) හා සේ.නි.භා.අ. (ETF) ගෙවීම් සඳහා රු. 627,577 ක් වැරදි ලෙස වැයකර තිබුණි. | (ඇ) සහ (ඇ) අදාළ කළමනාකරුගෙන් අයකර ගැනීමට අමාත්‍යාංශ පරීක්ෂණ කමිටුව යෝජනා කර තිබුණි. කෙසේ වෙතත්, කළමනාකරුවන් රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ අතර අභියාචනා ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | මුදල් අය කර ගැනීමට වහාම පියවර ගත යුතුය. |

## 3.8 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2006 හි මාර්ගෝපදේශ 4.2 ප්‍රකාරව වර්ෂය ආරම්භයේදී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේම, 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන ඒජන්සියේ චක්‍රලේඛ අංක 08 හි 4.2 වගන්තිය ප්‍රකාරව, අවම වශයෙන් අවුරුදු 03 ක කාලයක් සඳහා අපේක්ෂිත | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර කාල රාමුව සමඟ අමාත්‍යාංශයට සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට භාර දී ඇත. කෙසේ වෙතත්, අපි නියමිත වේලාවට රජයේ විගණනයට ඉදිරිපත් කර නැත. ඉදිරියේදී 2016 ප්‍රසම්පාදන චක්‍රලේඛයේ 4.2 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ජාතික ප්‍රසම්පාදන ඒජන්සියේ චක්‍රලේඛයට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ලැයිස්තුගත කළ යුතු අතර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන ආයතනය විසින් සකස් කළ යුතුය. කෙසේ වෙතත්, එවැනි ප්‍රසම්පාදන සැලැස්මක් විගණනයට ලබා දී නොතිබුණි. | මාර්ගෝපදේශ ප්‍රකාරව විගණනයට ඉදිරිපත් කිරීම සඳහා කළමනාකරණය විසින් අවශ්‍ය පියවර ගෙන තිබේ. | |

### 3.9 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2009 දී අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ අවශ්‍යතාවයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් පුද්ගලයෙකු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට උසස් කර ඇති අතර, එම බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව කනිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ නිලධාරීන් දෙදෙනෙකු නිෂ්පාදන කළමනාකරු සහ අභ්‍යන්තර විගණක තනතුරුවලට උසස් කර ඇත. | රේඛීය අමාත්‍යාංශයෙන් උපදෙස් බලාපොරොත්තු වේ. | බඳවා ගැනීමේ පරිපාටිය (SOR) සමඟ අනුකූල විය යුතුයග |